From
the People of Japan

**ජපාන රජයේ සහයෝගය ඇතිව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සෞඛ්‍ය අමාත්‍යාංශයට ශීතාගාරදාම උපකරණ පහසුකම ලබාදෙයි**

**ඡායාරූප සහ වීඩියෝ :** https://uni.cf/335r9s8

**2021 අප්‍රේල් 30 දින කොළඹදී.** ජපාන රජයේ සහයෝගය ඇතිව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබාදෙන ශීතාගාරදාම උපකරණවලින් පළමු තොගය අද භාරදෙනු ලැබිණි. මෙමගින් කොවිඩ්-19 ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ ශක්තිමත් කිරීමට හැකිවනු ඇත.

ප්‍රතිශක්තිකරණ එන්නත් සුරක්ෂිතව ප්‍රවාහනය කිරීමට භාවිතකරන බහාලුම් 500ක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ ශ්‍රී ලාංකීය නියෝජිත එමා බ්‍රිග්හැම් සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති සුගියාමා අකිරා විසින් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ කාර්යාලයේදී අද දින භාරදෙන ලදී. සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය විසින් මෙම අයිතම භාරගන්නා ලදී.

මීළඟ භාණ්ඩ තොගයට අයිස් ආස්තරණය කරන ලද ශීතකරණ 100ක්, ශීතකරණ උෂ්ණත්වය අධීක්ෂණය කරන උපකරණ 145ක් සහ ප්‍රතිශක්තිකරණ එන්නත් බහාලුම් 1,000ක් අඩංගු වේ.

"අප දැන් ආරම්භ කර තිබෙන කොවිඩ්-19 එන්නතේ දෙවෙනි මාත්‍රාව ලබා දීම ඇතුළු වර්තමාන එන්නත්කරණ කටයුතුවලට පමණක් නොව සමස්ත ප්‍රතිශක්තිකරණ වැඩසටහනටත් මේ උපකරණ ඉතා වැදගත්. මේ තීරණාත්මක අවධියේදී එන්නත්කරණ වැඩසටහන සහ අපගේ ශීතාගාරදාම කළමනාකරණය ශක්තිමත් කිරීමට අත්‍යවශ්‍ය වන මේ උපකරණ ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අපි ජපාන රජයට අපගේ ස්තූතිය පුදකර සිටිනවා. ශ්‍රී ලංකාව සහ ජපානය අතර තිබෙන්නේ දීර්ඝකාලීන සම්බන්ධතාවක්. අප රටට සහායදීමට ඔබ කිසි විටෙක පසුබට නොවන බව අප දන්නවා," වන්නිආරච්චි මහත්මිය පැවසුවාය.

"ඒ වගේම ශීතාගාරදාම උපකරණ සහ ප්‍රතිශක්තිකරණය ආශ්‍රිත ප්‍රසම්පාදන කටයුතුවල නිරත වෙමින් මේ මුළු කාලය පුරා යුනිසෙෆ් ආයතනය ශ්‍රී ලංකාවට ලබාදී තිබෙන සහායත් ඒ ගෞරවනීය හැඟීමෙන්ම මා සිහිපත් කළ යුතුයි. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් යුනිසෙෆ් ආයතනයට මම මගේ හෘදයංගම කෘතඥතාව පළ කර සිටිනවා," ඇය තව දුරටත් සඳහන් කළාය.

ජපානයේ ශ්‍රී ලංකා තානාපති සුගියාමා මහතා මේ අවස්ථාවේදී අදහස් දක්වමින්, "ලංකාවේ දිගුකාලීන මිතුරෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයින්ට මෙම ප්‍රතිශක්තිකරණ එන්නත ලබාගැනීමට සමාන අවස්ථාව ලබාදීමට සහාය දැක්වීමට මෙම අත්‍යවශ්‍ය ශීතාගාරදාම පද්ධති පහසුකම් ලබාදෙනවා. ජපානය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හරහා සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වලට මේ ආකාරයෙන් හදිසි අවස්ථා සහාය දක්වනවා. ශ්‍රී ලංකාවට ලබාදුන් ප්‍රතිශක්තිකරණ එන්නත් සුරක්ෂිතව ගෙනයා හැකි බහාලුම් 500 අප විසින් ක්‍රියාත්මක කරනු ලබන "Last One Mile Support" අත්‍යවශ්‍ය සහාය ලබාදීමේ වැඩසටහන යටතේ ලබාදෙන පළමු ප්‍රතිශක්තිකරණ උපකරණ කාණ්ඩයයි. මෙහිදී ඉතාමත් කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයට අපගේ ස්තූතිය පුදකරනවා. නියමිත උෂ්ණත්ව පාලනයක් යටතේ ආරක්ෂාකාරීව, නියමිත වේලාවට මෙම ප්‍රතිශක්තිකරණ එන්නත් බෙදාහැරීමට හැකිවීම මගින් ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ කඩිනමින් සිදුකරගෙන යාමට මෙම ප්‍රතිශක්තිකරණ එන්නත් බහාලුම් උපකාරීවනු ඇතැයි ජපාන රජය විශ්වාස කරනවා," යැයි ප්‍රකාශ කර සිටියේය.

ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතය සඳහා තෝරාගත් කණ්ඩායම් ඉලක්ක කරගෙන ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළට අනුව

මෙම කණ්ඩායම්වලට වැඩි අවදානම් ප්‍රදේශවල ජීවත්වන වයස අවුරුදු 60ට වඩා වයස්ගත කණ්ඩායම් අයත්වේ.

From
the People of Japan

“ප්‍රතිශක්තිකරණය විසින් අප එකිනෙකා සමීප කරනු ලබන අතර එමගින් ප්‍රතිශක්තිකරණය සාර්ථකත්වයට පත්වේ” යන තේමාව යටතේ ලෝක ප්‍රතිශක්තිකරණ සතිය සමරන මෙම අවස්ථාව මෙම ශීතාගාරදාම පහසුකම් උපකරණ ලබාදීමට සුදුසුම කාලය වේ.

කොවිඩ් වසංගත තත්වය හමුවේ අන් කවරදාටවත් වඩා වැදගත්වී තිබෙන ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ ජපාන රජය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදළ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාර්ශ්වකරණය මගින් ශක්තිමත්ව ප්‍රවර්ධනය වන අයුරු මනාව පැහැදිලි වන බව බ්‍රිග්හැම් මහත්මිය පැවසුවාය. ජපාන රජය සහ එම ජනතාව විසින් දීර්ඝ කාලයක් පුරා ලබාදෙන සහාය සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය ලබාදෙන ශක්තිමත් සහයෝගිතාව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ඉතාමත් අගය කරන බව ඇය පැවසුවාය.

කොවැක්ස් (COVAX) පහසුකම යටතේ මාර්තු මාසයේදී එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනෙකා ප්‍රතිශක්තිකරණ එන්නත්වල ප්‍රථම තොගය ගෙන එනු ලැබූ අතර ඒවා දැනටමත් ජනතාවට ලබාදෙමින් පවතී. අද දින ලැබුණු ශීතාගාරදාම පහසුකම් හා ලැබීමට නියමිත උපකරණද සමගින් එන්නත් ගබඩා කිරීම සහ කොවිඩ්-19 ප්‍රතිශක්තිකරණ වැඩසටහන ශක්තිමත්ව ක්‍රියාවට නැංවීමට උපකාර වනු ඇත.




ඡායාරූපය: ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය වෙත ශ්‍රී ලංකාවේ ජපාන තානාපති සුගියාමා අකිරා සහ යුනිසෙෆ් ශ්‍රී ලංකා නියෝජිත එමා බ්‍රිග්හැම් මහත්මියගෙන් එන්නත් බහාලුම් පිළිගන්වයි. ආචාර්ය (මිය) ටී.එල්.සී. සෝමතුංගල සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) ද මෙම අවස්ථාවට සහභාගී විය.

වැඩිදුර තොරතුරු සඳහා අමතන්න

යුනිසෙෆ් ශ්‍රී ලංකා; සුසාන් වූස්ටර් ප්‍රේමතිලක; +9477 316 5378; විද්‍යුත් තැපැල: swooster@unicef.org

ජපාන තානාපති කාර්යාලය; +94-11-269-3831; විද්‍යුත් තැපැල: econojpn@co.mofa.go.jp